www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තදින් බැට කන්නන්ගේ පාසල: ඩැනී බොයිල්ගේ ස්ලම්ඩෝග් මිලියනයර්

## The school of hard knocks: Danny Boyle’s Slumdog Millionaire

**හිරාම් ලී විසිනි**
**2009 ජනවාරි 16**



*ස්ලම්ඩෝග් මිලියනයර්හි රඟන ඩේව් පටෙල් සහ ෆ්‍රීඩා පින්ටෝ*

*අධ්‍යක්ෂනය ඩැනී බොයිල් සහ ලව්ලීන් ටැන්ඩන් (සම ඉන්දීය අධ්‍යක්ෂක), විකාස් ස්වෝරප්ගේ නවකතාවක් ඇසුරෙන් රචනය සයිමන් බියුෆෝයි*

ඉන්දියාවේ දී ලව්ලීන් ටැන්ඩන් විසින් සම අධ්‍යක්ෂිත ඩැනී බොයිල් විසින් අධ්‍යක්ෂනය කරන ලද ස්ලම්ඩෝග් මිලියනයර් චිත්‍රපටය ජනවාරි 11 දා පවත්වන ලද උත්සවයේ දී හොඳම සිනමා නිර්මානය සඳහා වන ගෝල්ඩන් ග්ලෝබ් ත්‍යාගය දිනා ගති. හොඳම අධ්‍යක්ෂනය සඳහා සම්මාන දිනා ඇති *ට්‍රේන්ස්පොටිං* (1996), *ආෆ්ටර් ටූ ඩේස්* (2002) සහ *මිලියන්ස්* (2004) යන චිත්‍රපට ද තැනූ බොයිල්ගේ *ස්ලම්ඩෝග් මිලියනයර්* 2008 වර්ෂයේ තනන ලද හොඳම චිත්‍රපට ශ්‍රේනිගත කිරීම් ගනනාවක ම ස්ථානයක් දිනා ගනිමින් බොහෝ උත්කර්ෂනයන්ගේ මාතෘකාවක් බවට පත්ව තිබේ.

චිත්‍රපටය ඇරඹෙන්නේ ප්‍රේක්ෂකයන්ට බහුවරන ප්‍රශ්නයක් ඉදිරිපත් කරමිනිඃ ''ජමාල් මලික් සිටින්නේ රුපියල් මිලියන 20ක් දිනාගැනීමට එක් ප්‍රශ්නයක් ඈතිනි. ඔහු එය කලේ කෙසේ ද?'' චිත්‍රපටයෙන් සම්පාදනය කරනු ලබන වියහැකි පිලිතුරු වන්නේඃ ''(1) ඔහු රැවටිලිකාරී වේ (2) ඔහු වාසනාවන්ත ය (3) ඔහු සුධීමතෙකි (4) එය ලියනු ලැබ ඇත.''

කතාව එතැන් සිට පෙරට ඇදෙන්නේ මුම්බායිහි මුඩුක්කු ප්‍රදේශයෙන් එන තරුනයෙක් වන ජමාල් මලික් (ඩේව් පටෙල්) ''දසලක්ෂපතියෙක් වීමට උවමනා කාට ද?'' යන ප්‍රදර්ශනාත්මක තරඟයට පෙනී සිටීමෙන් පසු පොලිස් අත්අඩංගුවට පත්වීම සමගිනි. පලමු දිනයේ පටිගත කිරීම අවසන් වනවිට එකක් හැර අනෙක් සියලු සරල ප්‍රශ්නවලට පිලතුරු දෙමින් ජමාල් සාර්ථකත්වයට පත්වන්නේ එහි දී රුපියල් මිලියන කිහිපයක් දිනාගනිමිනි. ඊ ලඟ දිනයේ පටිගත කිරීමේ දී රුපියල් මිලියන 20ක සුපිරි ත්‍යාගයක් දිනාගැනීම සඳහා එක් අවසාන ප්‍රශ්නයකට පිලිතුරු දීමට ඔහුට නියම කෙරේ.

තරුන ''ස්ලම්ඩෝග් (මුඩුක්කු බල්ලා -පරිවර්තක)'' තම ප්‍රශ්නවලට පිලිතුරු නො දන්නේ යයි උපකල්පනය කරමින් තරඟයේ නිෂ්පාදකයෝ ඔහුව ඔවුන්ගේ අධිකාරීන් වෙත රැවටීම සඳහා යොමු කරති. ඔහුව ශාරීරික වධයන්ට ලක් කෙරෙන නමුත් කිසිදු අපරාධයක් බාර නො ගනී. ඔහුව දුබල කිරීමට නො හැකි තැන පොලිස් විමර්ශකයා (ඉර්ෆාන් කාන්) ජමාල්ගේ කාර්ය සාධනයේ තැටියක් වාදනය කරමින් සෑම පිලිතුරක් ම දැන ගත්තේ කෙසේදැයි ඔහුගෙන් විමසයි.

ඔවුහු ප්‍රශ්නයෙන් ප්‍රශ්නය ගනිති. ඔහුගේ අනාගත රූපවාහිනී පෙනීසිටීමේ දී නිවැරදි ප්‍රතිචාර සම්පාදනය කරන කරුනු හෝ සරල ක්‍රම අහම්බයෙන් ඉගනගැනීමට උපකාරී වූ ලමාවියේ ක්ෂතිමය සිද්ධි සහ ලමාවියේ කතන්දර ජමාල් යලි මකයට නංවයි.

චිත්‍රපටයේ වඩාත් ම සිත්ගන්නා සුලු සහ තෘප්තිදායක කොටසේ මුම්බායිහි මුඩුක්කු තුල ජමාල්ගේ මුල් ලමාවිය සලකා බලයි. විශේෂයෙන් ම එක් ගුවන් රූපගත කිරීමක් දෘඪ හැඟීමක් ජනනය කරන්නේ මලකඩ කෑ බෙලෙක්ක තහඩු වහලවල් සහිත කිව නො හැකි තරම් ගනනක් මුඩුක්කු පෙන්නුම් කරමින් කැමරාව පසු පසට යද්දී ය. කාලකන්නි කොන්දේසි, මුඩුක්කුවකට අයත් වපසරිය, අයෙක් අනෙකාට කොතරම් කිට්ටු ද යන කරුනු විසින් නරඹන්නන් කම්පනයට පත් කරනු ලැබේ.

චිත්‍රපටයේ තවත් ශක්තිමත් අවස්ථාවක දී බහුතර මුස්ලිම් ප්‍රජාව හින්දු ස්වෝත්තමවාදී මැරයින් විසින් ආක්‍රමනය කරනු ලබයි. රටෙහි හින්දු අන්තවාදය පිලිබඳ සමාජ සහ ඓතිහාසික සන්දර්භය චිත්‍රපටයේ හිඟවුවත් මෙම අවස්ථාවේ සන්ත්‍රාසය හැඟීම් සමගින් සන්නිවේදනය කෙරේ.

මෙම පින්තූර සහ අනාථ ජමාල් හා ඔහුගේ සහෝදර සලීම් ගොඩකරන ලද බිමේ තාවකාලික කූඩාරම්වල ජීවත්වීම සහ වැසි කුනාටුවෙන් වැලකීමට දුම්රිය පාරේ හිස් බොක්ස් රථවල නිදාගැනීම පෙන්වන අනෙකුත් රූපරාමු අර්ථභාරී සහ වටිනා ඒවා වේ. චිත්‍රපටයේ ප්‍රවිෂ්ටයේ ගැඹුරු සීමාසහිත කම් තිබුනත් එම රූපරාමු බොහෝ නරඹන්නන් අතර පැහැදිලි බලපෑමක් ඇති කොට තිබේ.

ජමාල් සහ සලීම් වීදිවල හිතුමතයේ ජීවත්වන අතරතුර ඔවුන්ට ලතිකා නම් තරුන ලඳක් මුනගැසේ. ඇය ජමාල්ගේ ජීවිතයේ ආදරය බවට පත් වේ. මෙම තිදෙනාව දරුනු අනාථාගාරයකට ගෙනයන ලද කල ලතිකා තනිකර දමා පිරිමි ලමුන් දෙදෙනා පලා යති. චිත්‍රපටයේ දෙවන කොටස මූලිකව නාභිගත වන්නේ ඇය සමග යලි එක්වීමට ජමාල් දරන ආයාසයන් මත ය.

නිරන්තරයෙන් සසලකාරී ජමාල්-ලතිකා ආදර කතාව පැහැදිලිව හා ශෝචනීය ලෙස ''යුග ගනනාවකට එකක්'' යයි ශෛලී ගතකොට තිබේ. අවිනිශ්චිත නො වන පදවලින් ජමාල් සහ ලතිකා එක්වීමට නියමිත අය යයි චිත්‍රපටය ඉඟියෙන් අපට දැනගැනීමට සලස්වයි. ජමාල් පැවැත්ම සඳහා වීදිවල හැලහැප්පෙද්දී සහ ලතිකා (ෆ්‍රීඩා පින්ටෝ) විවිධ ධනවත් මිනිසුන්ගේ මිලැති වස්තුවක් බවට පත්වන ආදරවන්තයන්ගේ අසීරු අවස්ථාවන් මගින් මෙම විය-හැකි ඉහත කී දෙය නිතර ම පෙන්වයි.

චිත්‍රපටයේ පලමු අර්ධයේ ඉදිරිපත් කෙරෙන කථා සහ පරිකල්පන රූප කුමකින් ශක්තිමත් වුවත් ප්‍රේක්ෂකයා වහා වටහා ගන්නා දෙය වන්නේ චිත්‍රපටයේ කේන්ද්‍රීය අවධානය යොමුවී ඇත්තේ අන්ත දුගීභාවයේ හෝ අවසානයේ ජමාල්ගේ සහෝදර සලීම්ට ජීවිතය අහිමි කෙරෙන මැරවර පරිසරයේ ''මුඩුක්කු බල්ලන්'' ලෙස ජීවත්වීමට බල කෙරී ඇත්තවුන්ගේ තත්වයට නොව ඉරනම, දෛවය සහ ඇත්ත වසයෙන් ම සියලු දෙනා වෙලාගන්නා ''සත්‍ය ප්‍රේමය''ට බව යි.

ජමාල් තරඟයේ පෙනීසිටීම මගින් සන්නිවේදනය කරන්නේ කුමක් ද යන්න පිලිබඳව යමෙකු ට නිශ්චිත සීමාවන් තිබේ. සෑම අවස්ථාවක දී ම ජමාල්ගේ බුද්ධියට අධම උද්‍යෝගයෙන් යුතුව අවමන් කරන තරඟය මෙහෙයවන්නා සමග ජමාල් කරන තරඟයෙන් ඔහුගේ ජයග්‍රහනය නිරූපනය කිරීම තුල ජනප්‍රියවාදී මනෝගතියක් ක්‍රියාකාරී වේ. ජමාල් උසස් අධ්‍යාපනයේ නොව වීදියේ යථා ලෝකයේ සැබෑ අධ්‍යාපනයේ නිෂ්පාදනයක් බව චිත්‍රපටය යෝජනා කරයි. ඔහුට කිරීමට හැකි දෑ නිකමට බලන්න. සියලු විකාරයන් ඔහුට එරෙහිව පෙලගස්සවා තිබුන ද ඔහු ඔබගේ පද්ධතිය උපායෙන් පරදා රුපියල් මිලියන 20 ලබාගනී.

සමාජමය කෝපයේ සහ ප්‍රතිරෝධයේ ප්‍රකාශනයක් ලෙස එවැනි දැක්මකට යම් තැනක් තිබිය හැකි වුවත් තම කොන්දේසිවලට එරෙහි අරගලය පසෙක තැබුවත් පවත්නා ලෝකය තුල තම මංපෙත් පාදාගැනීම සඳහා ගැඹුරු ඥානය සහ අධ්‍යාපනය අනවශ්‍ය ය යන අදහස අලස සහ ප්‍රතිගාමී වේ.

තරඟයේ යෙදෙන කාලසීමාවේ ජනතා වීරයෙක් බවට පත්වන ජමාල් දිලින්දන්ගේ ආශීර්වාදය ද ලබයි. වඩාත් නරක වන්නේ ඍජුව ඉස්මත්තට එන ගැටලු ගැන කතා නො කොට ජමාල්ගේ දෛවය වනාහි මුදල් දිනාගෙන ගැහැනු ළමයා ලබාගැනීම බව ප්‍රකාශ කිරීම යි. විය නො හැකි සුබාන්තය හැතපුම් කිහිපයක් එපිටින් පැමිනෙනු යමෙක් දැකගනිති.

ඔහු කලයුතු ලෙස චිත්‍රපටයේ චිත්තවේගී අවසාන ජවනිකාවේ ''මුඩුක්කු බලු දශලක්ෂපතියා'' ලතිකා සමග යලි එක් වන තතු තුල චිත්‍රපටකරුවෝ ගාම්භීරත්වය පිලිබඳ කිසියම් ආකාර මවාපෑමක් තිබුනි නම් එය පලවා හරිති. අවසන් විශ්වාසය ද පලුදු වී යද්දී ජමාල්, ලතිකා සහ තවත් අතිරේක සිය ගනනක් හෝ ඊටත් වැඩි පිරිසක් බොලිවුඩ් ශෛලියේ නැටුමකට සහභාගි වෙති.

මෙම අප්‍රියජනක සැමරීම අත්‍යන්තයෙන් ව්‍යාජ ස්වරයක් වද්දයි. මෙම සමාප්තියේ ස්වභාවය පිලිබඳව යමෙක් පුදුමයට පත්වීමට අත්හැර දමයි. දැන් ජමාල් දශලක්ෂපතියෙකි. ඔහු ගැහැනු ළමයා හිමිකර ගත්තේ ය. ලෝකයේ සියල්ල දැන් ඉතින් හරි ය. සුබාන්ත අවසානය කරා අලුතනේ බච්චීස්මය ලද දශලක්ෂපතියා නටමින් යද්දී තමන්ගේ පාර්ශවයට දෛවය කැරකෙන්නේ නැති මුම්බායිහි මුඩුක්කුවල සිටින අනෙකුත් ගිනිය නො හැකි ජමාල්ලා පිලිබඳව සිතීමෙන් යමෙකුට වැලකිය නො හැකි ය. ඔවුන්ට සිදුවනු ඇත්තේ කුමක් ද?

© www.wsws.org